**ශීර්ෂය 300 - ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 300 - ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුලි 27 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

------------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

--------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 358.30 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 343.86 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 14.44 ක් හෙවත් සියයට 4.03 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 298.87 | 294.28 | 4.59 | 1.54 |
| මූලධන | 59.43 | 49.58 | 9.85 | 16.57 |
| **එකතුව** | **358.30** | **343.86** | **14.44** | **4.03** |

**2.2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 30001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු මිලියන |
| 6.00 | 6.00 | 3.40 | 3.42 | 42.00 | 18.66 |

**2.3 පොදු තැන්පත් ගිණුම්**

දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් 04 ක ශේෂ එකතුව රු. මිලියන 155.60 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0008/0013/000 | 76.67 |
| 6000/0000/00/0016/0120/000 | 6.20 |
| 6000/0000/00/0013/0131/000 | 71.83 |
| 6000/0000/00/0001/0125/000 | 0.90 |
| එකතුව | **155.60** |

**2.4 විගණන නිරීක්ෂණය**

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 විසර්ජන ගිණුම**

2015 දෙසැම්බර් 29 දිනැති අංක 7/ 2015 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව ඉන්ධන ප්‍රතිපාදනයෙන් සියයට 15 ක් ඉතිරි කළ යුතු වුවද, එම වැය විෂයයෙන් සියයට 9.5 ක් පමණක් ඉතිරි කර තිබුණි.

**3.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

**3.3 විගණන සාක්ෂි නොවීම**

විස්තරාත්මක උපලේඛන, ශේෂ සනාථ කිරීම්, කාල විශ්ලේෂණ හා සමීක්ෂණ මණ්ඩල වාර්තා ආදී වූ අවශ්‍ය සාක්ෂි නොතිබීම නිසා රු.මිලියන 1,072 ක් වූ ගිණුම් විෂයයන් 11 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**3.4 පොදු තැන්පත් ගිණුම**

අංක 6000/0000/00/0013/0131/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට රු.71,830,173 ක ශේෂයක් පැවතුණි. එම ශේෂ 1989 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසන් වන විට ලැබී තිබුණු තැන්පතුවලින් සමන්විත වූ අතර, එයින් රජයේ ආදායමට බැර කළ හැකි ආදායම් පිළිබඳව සොයා බලා මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.5 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 30001 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 3.65 ක් විය. එම හිඟ හිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයකට අයත් වූ අතර 2017 අගෝස්තු 15 දින වන විට ඉන් රු.මිලියන 1.12 ක් අයවී තිබුණි.

**3.6 ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම**

2003 දෙසැම්බර් 10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, 2004 අගෝස්තු 23 දිනැති අතිරේක අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක බීඩී/ඒඩීජ්සී/සීඕඑම්/එෆ්සී/එෆ්ඩී ලිපිය මඟින් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වූ ආහාර මිලදී ගැනීමේ හා බෙදා හැරීමේ අත්තිකාරම් ගිණුම 2004 දෙසැම්බර් 31 දිනට වසා දැමීමට හා ඈවර කිරීමේ කටයුතු සඳහා දෙපාර්තමේන්තුව හෝ අමාත්‍යාංශය යටතේ ඈවර කිරීමේ ඒකකයක් පවත්වාගෙන යාමට උපදෙස් දී තිබුණි. එවැනි ඒකකයක් පවත්වා තිබුණු බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ අතර, එම ඈවර කටයුතු ආහාර කොමසාරිස් විසින් සිදුකර තිබුණි. එසේ වුවද, වර්ෂ 12 ක් ඒ වෙනුවෙන් ගතවී තිබියදීත්, ඈවර කිරීමේ කටයුතු නිමකර නොතිබුණි.

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඈවර කිරීමේ ඒකකයක් පත් කර තිබුණු බවට සාක්ෂි නොතිබුණද, 2005 ජනවාරි 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු.45,351,746 ක් වූ වත්කම් ගැලපීම් හා උපලබ්ධි කිරීම්ද, රු.75,902 ක් වූ බැරකම් ගැලපීම් හා පියවීම් සියල්ලම ආහාර කොමසාරිස්වරයා විසින් සිදු කර තිබුණි.

(ආ) අත්තිකාරම් ගිණුම 2005 ජනවාරි 01 දින සිට ඈවර කරමින් පවතින අතර, මෙහි සමස්ථ කාරක පාඩුව රු.981,398,869 ක් වී තිබුණි. එම ප්‍රමාණය කපා හැරීමට හා ගිණුම්ගත කිරීමට අදාළ ක්‍රියාපටිපාටිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීමට 2010 නොවැම්බර් 04 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ඉන්

රු.342,396,972 ක් කපා හැර තිබූ අතර තවදුරටත් කපා හැරීමට ඇති ශේෂය රු.639,001,897 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු.598,640,879 ක් ලෙස රු.40,361,018 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ආහාර දෙපාර්තමේන්තුව විසින් බාහිර ආයතන වෙත කුලියට ලබා දී තිබුණු ගබඩා 59 කින් 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ගබඩා කුලීවල එකතුව රු.68,291,040 ක් වී තිබුණි. 2017 ජූනි 30 දින වනවිට ඉන් තවදුරටත් අයවිය යුතු හිඟ කුලිය රු.44,577,761 ක් වී තිබුණි. එම ගබඩාවලින් ගබඩා 22 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට නැවත පවරාගෙන තිබුණු අතර ඉන් එකතුව රු.32,005,603 ක් 2017 ජූනි 30 දින වන විට අයවිය යුතුව තිබුණි.

(ඇ) ආයතන හා පුද්ගලයින් 5 දෙනකු වෙත බදු පදනම මත ලබා දී තිබූ ගොඩනැගිලි වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු හිඟ විදුලි හා ජල ගාස්තුවල එකතුව රු.1,394,807 ක් වී තිබුණි.

(ඉ) 2016 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු එකතුව රු.309,680,825 ක් වූ ණයගැති ශේෂ අයකර ගැනීම ඉතාම දුර්වල මට්ටමක පැවතුණි.

### 3.7 කාර්යසාධනය

2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ලබාගෙන තිබුණු කාර්යසාධනය සම්බන්ධයෙන් විගණනයේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල සීමාව සඳහා ආහාර දෙපාර්තමේන්තුව පිළියෙල කළ සංයුක්ත සැලැස්ම අනුව දෙපාර්තමේන්තුව සතුව මෙ.ටො.50,000 ක ආරක්ෂිත සහල් තොගයක් පවත්වා ගෙන යාමට සැලැසුම් කර තිබුණි. ඊට අනුකූලව සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව 2016 වර්ෂයේදී මෙ.ටො.50,000 ක සහල් ආරක්ෂිත තොගයක් පවත්වා ගැනීමට සැලැසුම් කර තිබුණි. ඒ අනුව සහල් මෙටො 10,800 ක් ගබඩා කළ හැකි පරිදි වේයන්ගොඩ අංක 9 සහ 10 ගබඩා විද්‍යාත්මක ගබඩා බවට පත් කිරීමට රු.43,724,305 ක් වියදම් කර තිබුණි. එසේ වුවද, 2016 ජනවාරි 01 දින සිට 2017 ජූනි 30 දින දක්වාම ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩාවල කිසිදු ආරක්ෂිත සහල් තොගයක් නොතිබුණි. කෙසේ වෙතත් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ ව්‍යාපෘති අනුමත නොවූ බැවින් යෝජිත පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව ආහාර කොමසාරිස්වරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ආ) 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කර තිබුණු අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණද, ආහාර දෙපාර්තමේන්තුව සතු වේයන්ගොඩ ගබඩා පරිශ්‍රයෙහි ගබඩා 05 ක් විද්‍යාත්මක ගබඩා ලෙස වැඩිදියුණු කර තිබුණි. මේ සඳහා 2016 අප්‍රේල් 27 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 16/0619/723/016 යටතේ රු.මිලියන 214 ක් අනුමත කර තිබූ අතර එම මුදලින් 2016 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 38.22 ක් වැය කර තිබුණි.

(ඇ) 2016 වර්ෂයේදී ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩාවල ආරක්ෂිත සහල් තොග නොතිබුණද, නවීකරණය කරන ලද වේයන්ගොඩ අංක 09 හා 10 ගබඩාවල උෂ්ණත්වය නියමිත පරිදි පවත්වා ගැනීමට අවශ්‍ය විදුලිය සඳහා 2016 ජනවාරි මාසයේ සිට 2017 මැයි මාසය දක්වා රු.387,100 ක් වැය කර තිබුණි.

## 3.8 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කළමනාකරණ දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ඔරුගොඩවත්ත අංක 15 සහ 16 ගබඩා 2009 වර්ෂයට පෙර බදු ගෙන තිබූ පුද්ගලික සමාගමකින් දෙපාර්තමේන්තුවට 2017 ජූනි 30 දින වන විට රු.14,834,093 ක් අයවීමට තිබුණි. එම සමාගම විසින් ගබඩා භූමිය තුළ ඉදිකරන ලද මාර්ග, කාර්යාල හා බහාලුම් පරීක්ෂක අට්ටාල නිර්මාණය සඳහා වටිනාකම රු.13,100,000 ක් ලෙස, රජයේ තක්සේරුකරු විසින් තක්සේරු කර තිබුණි. එම මුදල පසු බදුකරු වන වෙනත් පුද්ගලික ආයතනයකින් අය කරගෙන තිබුණද, පෙර සමාගම සමඟ වූ ගනුදෙනු නිරවුල් කර නොතිබුණි.

(ආ) ආහාර දෙපාර්තමේන්තුව සතුව පවතින ගබඩා 10 ක් ලංකා සතොස ආයතනයට කුලියට දී තිබුණද, ඉන් ගබඩා 08 ක් සඳහා ගිවිසුම් අත්සන් කර නොතිබුණි. ගිවිසුම් අත්සන් කළ ගබඩා 02 ක ගිවිසුම් කාලය අවසන් වී තිබුණද, ගිවිසුම් අළුත් කර නොතිබුණි. මෙම ගබඩා වලින් 2016 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතුව තිබුණු හිඟ කුලි වටිනාකම රු.19,432,103 ක්වූ අතර එම හිඟ කුලී අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. ගබඩා බදු දීමේදී මූලික තැන්පතු මුදල් ලබා ගෙන නොතිබීම හේතුවෙන් හිඟහිටි කුලී මුදල් එම තැන්පතුවලින් හෝ හිලව් කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) ත්‍රිකුණාමලය, චීන වරාය පිහිටි ධාන්‍යාගම නිවාස සංකීර්ණයේ තිබූ නිවාස 352 ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් 1982 මාර්තු 12 දින ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව පවරා දී තිබුණි. එම නිවාස සංකීර්ණය පිහිටා තිබූ භූමියේ අයිතිය ආහාර කොමසාරිස් වෙත පැවරී නොතිබුණි. එම නිවාස ප්‍රීමා සමාගමේ සේවකයන්ට හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවකයන් වෙත කුලී පදනම මත ලබා දී තිබූ අතර එම රජයේ නිවාසවලින් 2016 දෙසැම්බර් 31 දින වන විට රු.1,787,742 ක කුලියක් ලැබිය යුතුව තිබුණි. 2017 අගෝස්තු 15 දින වනවිට ඉන් රු.411,688 ක් අය වී තිබුණි.

(ඈ) වේයන්ගොඩ විද්‍යාත්මක ගබඩාවේ, ගබඩා කිරීම සඳහා 2012 වර්ෂයේදී පෞද්ගලික සහල් මෝල් හිමියන් දෙදෙනකු වෙත සහල් ලබා දීමේ පදනම මත නිකුත් කරන ලද වී වලින් ලබා නොදුන් සහල් සඳහා මෝල්හිමියන් දෙදෙනකුගෙන් අයවිය යුතු රු.7,190,700 ක් අයකර ගැනීමට 2014 වර්ෂයේදී නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර තිබුණි. 2017 ජූනි 30 දින වන විටත් එම මුදල්, දෙපාර්තමේන්තුව වෙත අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

## 3.9 පාඩු හා හානි

2016 ජනවාරි 31 දිනට පෙර සම්පූර්ණ වර්ෂය සඳහා එකවර වරිපනම් ගෙවීමේදී මුළු වරිපනම් මුදලෙන් සියයට 10 ක වට්ටමක් ලබා ගත හැකි වුවද, 2016 වර්ෂයේ වරිපනම් බදු මුදලට අදාළ රු.1,275,397 ක්වූ චෙක්පත කොළඹ මහ නගර සභාව වෙත නියමිත දිනට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.88,569 ක වට්ටම් වාසිය ලබාගැනීමට නොහැකි වී තිබුණි.

**3.10 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | 03 | 02 | - |
| (ii) | ද්විතියික මට්ටම | 116 | 47 | 69 | - |
| (iii) | තෘතියික මට්ටම | 03 | 01 | 02 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 106 | 59 | 54 | 07 |
| (v) | වෙනත්- (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 02 | - | 02 |
| | **එකතුව** | **230** | **112** | **127** | **09** |